**2020 නොවැම්බර් 09 වන දින සිට වර්තමාන තත්වය යටතේ විශ්වවිද්‍යාලයීය කටයුතු පවත්වාගෙන යාම**

හිතවත් සියළුදෙනා වෙත,

2020 නොවැම්බර් 09 වන දින උදෑසන 5.00ට රට පුරා ඇඳිරි නීතිය ඉවත් කළද, දැනට පවතින කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් රට තුළ ඇතැම් ප්‍රදේශ හුදකලා කරන බව රජය විසින් නිවේදනය කර ඇත.

රට තවමත් Alert 3 (තෙවන මට්ටම) යටතේ පවතින බැවින්, නැවත දැනුම් දෙන තුරු විශ්වවිද්‍යාලයීය ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පහත සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කරනු ලැබේ.

- රජය විසින් පනවා ඇති සීමාවන් හා කොන්දේසිවලට යටත්ව විශ්වවිද්‍යාලයේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මකවන අතර බොහෝ දුරට නිවසේ සිට සහ මාර්ගගත ක්‍රමයට රාජකාරී කටයුතු සිදු කෙරේ.
- සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශවලට අනුකූලව ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන (බස්නාහිර පළාතේ සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හැර) **සුපුරුදු පරිදි අඛණ්ඩව ක්‍රියාත්මක වේ.**
- මෙම කාල සීමාව තුළ තාවකාලික හා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සිදු කළ යුතු රාජකාරී කටයුතු අදාළ අධ්‍යනාංශ/ අංශ ප්‍රධානීන් විසින් පැවරිය යුතුය. අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් දිනපතා නිවසේ සිට සිදු කරන ලද රාජකාරී කටයුතු පිළිබඳ දෛනික වාර්තා සහිතව දිනපොතක් පවත්වාගත යුතුය.
- දෛනික පැවරුම් පදනම මත (Daily Assignment Basis) සේවයේ නියුතු සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා අංශ ප්‍රධානීන් විසින් ලිඛිත රාජකාරී ලැයිස්තුවක් ලබා දිය යුතු අතර අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් දිනපතා සිදු කරන ලද රාජකාරී කටයුතු පිළිබඳ දෛනික වාර්තා සහිතව දිනපොතක් පවත්වාගත යුතුය.
- මහජන තොරතුරු අංශය විසින් ශිෂ්‍යයන් සඳහා (Hotline) දුරකථන අංකයක් (දුරකථන හා විද්‍යුත් තැපැල) යන දෙකම පවත්වාගෙන යා යුතු අතර ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටළු සඳහා පිළිතුරු ලබා දීම සඳහා එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු පත් කළ යුතුය. මේ සඳහා මහජන තොරතුරු අංශ කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත දැනටමත් ජංගම දුරකථන ලබා දී ඇත. මෙම දුරකථන අංක විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ පළ කළ යුතු අතර ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටළු සඳහා අවශ්‍ය පියවර ගැනීම වෙනුවෙන් අදාළ අධ්‍යනාංශ/ අංශ ප්‍රධානීන් වෙත යොමු කළ යුතුය.
- හැකිතාක් දුරට මාර්ගගත තාක්ෂණය භාවිතා කරමින් සුපුරුදු පරිදි නියමිත රැස්වීම් පැවැත්විය යුතුය.
- විශ්වවිද්‍යාලයේ ඕනෑම කාර්ය මණ්ඩල සාමාජිකයෙකු සේවා අවශ්‍යතාවය සහ හදිසි අවස්ථාවලදී විශ්වවිද්‍යාලයේ රාජකාරී සඳහා සේවයට වාර්තා කළ යුතු වේ.
- මෙම දුෂ්කර කාල සීමාව තුළ මෙම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමේදී සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් විශ්වවිද්‍යාල බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කරුණාකර ඔබගේ ආරක්ෂාව මෙන්ම අන් අයගේ ආරක්ෂාව වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ලබා දී ඇති සියලුම මාර්ගෝපදේශවලට අනුගතව කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි.

**උපකුලපති**